**අධ්‍යාපන අංශ සංවර්ධනය කිරීමේ වැඩසටහනේ - පළාත් මට්ටම - 2017**

---

අධ්‍යාපන අංශ සංවර්ධනය කිරීමේ වැඩසටහනේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසංබැ) අතර 2013 අගෝස්තු 19 දින එළඹි අංක 3008 එස්ආර්අයි සාමාන්‍ය මෙහෙයුම් හා අංක 3009 එස්ආර්අයි විශේෂ මෙහෙයුම් ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.04 වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය**

---

ණය ගිවිසුම්වලට අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතියේ ජාතික මට්ටමේ කාර්යයන් සිදුකිරීමට අපේක්ෂා කරන අතර පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සහ සියලුම පළාත් සභාවල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ විසින් පළාත් මට්ටමේ කාර්යයන් සිදුකිරීමට අපේක්ෂා කෙරේ. ණය ගිවිසුම්වලට අනුව, රටේ සාමාන්‍ය අධ්‍යාපන අංශ මුහුණ දෙන අභියෝග භාර ගැනීමට 2013-2017 අධ්‍යාපන අංශ සංවර්ධන කාර්යය රාමුව සහ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට මූල්‍ය සහයෝගය ලබාදීම සඳහා වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. ද්විතීයික පාසල්වල පිරිමි හා කාන්තා උපාධිධාරී සේවා නියුක්තිය ඉහළ නංවන නවීන ද්විතීයික පාසල් අධ්‍යාපන ක්‍රමයක් වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. ණය ගිවිසුම්වලට ප්‍රකාරව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 26,000 කට සමාන එජඩො මිලියන 200 ක් වේ. වැඩසටහනේ කාර්යයන් 2013 අගෝස්තු 23 දින ආරම්භ කරන ලද අතර 2018 අගෝස්තු 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් සිදු කරන ලද කාර්යයන් පිළිබඳ මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.3 ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

පළාත් සභාවල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයන්හී විසර්ජන ගිණුම්වල සංග්‍රහයක් වූ මෙම ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා, පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තාවේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තාවේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තාව පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා

නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තාවේ සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහනේ කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තාවේ දැක්වෙන වියදම් වැඩසටහන විසින් පවත්වාගෙන යන ලද වැඩි දියුණු කරන ලද මූල්‍ය වාර්තා සහ ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් අධ්‍යාපන අංශය සඳහා ලද අරමුදල් වලින් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ අධ්‍යාපන අංශයේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) මුදල් රෙගුලාසි 150 සහ අදාළ පළාත් සභා ප්‍රධාන ලේකම්වරු විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කර තිබුණේ ද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඌ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

-------

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද 2017 වර්ෂය සඳහා පළාත් සභා නවයෙහි විසර්ජන ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 සහ අදාළ පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස්වල සඳහන් විධිවිධානවලට අනුකූල වන පරිදි පිළියෙල කර ඉදිරිපත් කර ඇති බව, ඉහත විසර්ජන ගිණුම් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්, වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා පළාත් සභාවල

අධ්‍යාපන අමාත්‍යාංශ විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත්, ලේඛන හා වාර්තා සමඟ එකඟ වන බව, ණය මුදල්වලින් දරන ලද පිරිවැය පළාත් සභාවල අධ්‍යාපන අමාත්‍යාංශවල 2017 වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම්වල නියමිත පරිදි වාර්තා කර තිබුණු බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් ප්‍රකාරව මූල්‍යයනය කිරීම සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2017 වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දක්වා | |
| | **එජඩො මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **එජඩො මිලියන** | **රු. මිලියන** | **එජඩො මිලියන** | **රු. මිලියන** |
| ආසංබැ | 200 | 26,000 | 4,080 | 30 | 4,594.20 | 177 | 21,787.25 |
| | **200** | **26,000** | **4,080** | **30** | **4,594.20** | **177** | **21,787.25** |

පළාත් සභාවල 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම් අනුව, සමාලෝචිත වර්ෂය සඳහා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල මූලධන වියදම් දැරීමට පළාත් සභා සඳහා රු. මිලියන 18,730 ක් වෙන්කර තිබුණු අතර එයින් 2017 දෙසැම්බර් 31 වනවිට එකතුව රු.මිලියන 9,916 ක් උපයෝජනය කර තිබුණි. තවද, උතුරු මැද පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ මූලධන වියදම් දැරීමට සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කර තිබූ රු.මිලියන 7,645 ක වෙන් කිරීමෙන් එකතුව රු.මිලියන 2,745 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඊට අමතරව, සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ඌව පළාතේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ මූලධන වියදම් දැරීමට කර තිබුණු වෙන්කිරීමෙන් සියයට 62 ක් වියදම් නොකර පැවති බව අනාවරණය විය.

### 3.2 භෞතික ප්‍රගතිය

මූල්‍ය ගිවිසුමේ උපලේඛන 03 හි ඇමුණුම 01 අනුව, වියපැහැදම් කිරීම් සබැඳි දර්ශක 33 ක් යටතේ වියපැහැදම් කිරීම් සබැඳි ප්‍රතිඵල 09 ක් ළඟාකර ගැනීම සඳහා වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. තවද, පළාත් සභා විසින් අධ්‍යාපන අංශය සඳහා සියලු අරමුදල් මූලාශ්‍රවලින් 2017 දෙසැම්බර් 31 දිනට දරන ලද මුළු වියදම වූ රු. මිලියන 134,154 ක් නියෝජනය වන ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තා 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ලෙස විගණනයට ඉදිරිපත්

කර තිබුණි. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල මෙහෙයුම්වලට අදාළ කරන ලද ප්‍රධාන විගණන නිරීක්ෂණ කිහිපයක් පහත ඉදිරිපත් කරනු ලැබේ.

(අ) වියපැහැදම් කිරීම සබැදි ප්‍රතිඵල 02 යටතේ සඳහන් ඉලක්කවලට අනුව, අපොස (උසස් පෙළ) විභාගයේ සමත් ප්‍රතිශතය සියයට 65 ක් දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී අදාළ සමත් ප්‍රතිශතය සියයට 66.02 ක්ව පැවතුණි. කෙසේ වුවද, නැගෙනහිර සහ උතුරු මැද පළාත්වල පාසල් අයදුම්කරුවන්ගේ අපොස (උසස් පෙළ) සමත් ප්‍රතිශතය පිළිවෙලින් සියයට 62.46 ක් සහ සියයට 63.01 ක් ලෙස සාමාන්‍ය සමත් ප්‍රතිශතයට වඩා පහළ මට්ටමක පැවතුණි. 2017 වර්ෂයේ පැවති අපොස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල විශ්ලේෂණය මත පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කලා විෂය ධාරාවෙන් විෂයයන් 03 ම සමත් ප්‍රතිශතය සියයට 73.82 ක් ලෙස පැවති අතර විභාගයේ විෂයයන් 03 ම සමත් වීමේ සමස්ත ප්‍රතිශතය ඉහළ නැංවීමට එය විශාල ලෙස බලපා තිබුණි.

(ii) විභාග දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාවට අනුව, අපොස (උසස් පෙළ) විභාගයට අසුන්ගත් පාසල් අයදුම්කරුවන් 206,630 ක් අතුරින් සියයට 8.21 ක් නියෝජනය කරනු ලබන පාසල් අයදුම්කරුවන් 16,921 ක් සියළු විෂය ධාරාවන්ගෙන් සියළු විෂයයන් අසමත් වී තිබුණි. තවද, උතුරු මැද, උතුරු සහ දකුණු පළාත්වල සියයට 09 කට වඩා පාසල් අයදුම්කරුවන් සියළුම විෂය ධාරාවන්ගෙන් සියළු විෂයයන් අසමත්වී තිබුණු බව නිරීක්ෂණය විය.

(iii) විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීමේ සියයට 71.17 ක ඉහල ප්‍රතිශතයක් වාණිජ විෂයධාරාවේ පාසල් අයදුම්කරුවන් වාර්තා කළ අතර භෞතික විද්‍යා විෂයධාරාවෙන් පාසල් අයදුම්කරුවන් සියයට 54.05 ක් සහ ජීව විද්‍යා විෂයධාරාවෙන් පාසල් අයදුම්කරුවන් සියයට 55.71 ක් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබුණි. තවද, ඉංජිනේරු තාක්ෂණය සහ ජීව විද්‍යා විෂය ධාරාවලින් අධ්‍යයන කටයුතු කළ පාසල් අයදුම්කරුවන් පිළිවෙලින් සියයට 57.74 ක් සහ සියයට 61.79 ක සමත් ප්‍රතිශතයක් වාර්තා කර තිබුණි.

(ආ) වියපැහැදම් කිරීම සැබැඳ ප්‍රතිඵල 03 අනුව, පාසල් 100 ක තාක්ෂණික විෂයධාරාව හදාරන ශිෂ්‍යයින්ගේ කාර්යසාධනය ඇගයීමක් සිදුකිරීමට හා තාක්ෂණ විෂයධාරාව හදාරන ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය ඇතුළත් වීම ව්‍යාප්ත කිරීම සඳහා කාල සීමා සැලැස්මක් සකස් කිරීම සඳහා අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, ඒ සඳහා ඇගයීමක් සිදුකිරීමට හා කාලසීමා සැලැස්මක් සකස් කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ඇ) වියපැහැදම් කිරීම සැබැඳ ප්‍රතිඵල - 05 අනුව, අවම වශයෙන් මුළු ඇතුළත්වීමෙන් ගැහැණු ළමුන් සියයට 25 ක් තහවුරු වන පරිදි පළාත් පාසල්වල අ.පො.ස.(උසස් පෙළ) විද්‍යා විෂය ධාරාව හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 28 ක් දක්වා වැඩි කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් ලැබී තිබුණු තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළදී විද්‍යා විෂයධාරාව හැදෑරීම සඳහා ශිෂ්‍යයින්ගේ ඇතුළත්වීම සියයට 21.31 ක් ව පැවතුණි.

(ඈ) වියපැහැදම් කිරීම සබැඳ ප්‍රතිඵල - 06 අනුව, අ.පො.ස.(උසස් පෙළ ) වාණිජ විෂයධාරාව හැදෑරීම සඳහා පළාත් පාසල්වල ශිෂ්‍යයින්ගේ ඇතුළත්වීම සියයට 33 ක් දක්වා ඉහල නැංවීමට අපේක්ෂා කළ අතර අවම වශයෙන් සියයට 29 ක් ගැහැණු ළමුන් ඇතුළත්වීම අපේක්ෂා කරන ලදි. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් ලැබී තිබුණු තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළදී වාණිජ විෂයධාරාව හැදෑරීම සඳහා ශිෂ්‍යයින්ගේ ඇතුළත්වීම සියයට 22.27 ක් ව

පැවතුණු අතර වාණිජ විෂයධාරාව හැදෑරීම සඳහා ශිෂ්‍යයින්ගේ ඇතුළත්වීමෙන් ගැහැණු ළමුන්ගේ ඇතුළත්වීම සියයට 20.45 කට සීමාවී තිබුණි.

(ඉ) ව්‍යාපෘති කිරීම සැබැඳ ප්‍රතිඵල-07 අනුව, පුහුණු අවස්ථා ලබාදීම තුළින් විදුහල්පතිවරුන්ගේ සහ නියෝජ්‍ය විදුහල්පතිවරුන්ගේ කාර්යසාධනය වැඩිකිරීමට අපේක්ෂා කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් ඒ සඳහා එකතුව රු.මිලියන 32 ක් වැයකර තිබුණි. ඌව පළාතේ පාසල් 442 ක විදුහල්පති තනතුරු පුරප්පාඩුව පැවති අතර අනෙකුත් පාසල් 124 හි විදුහල්පතිවරු අතිරික්තව පැවති බව සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී අනාවරණය වී තිබුණි. තවද, වයඹ පළාතේ පාසල් 177 ක විදුහල්පති තනතුරු පුරප්පාඩුව පැවති අතර අනෙකුත් පාසල් 38 ක විදුහල්පතිවරු අතිරික්තව පැවතුණි. පළාත් මට්ටමින් පාසල් විදුහල්පතිවරුන්ගේ වෙන්කිරීම සාධාරණ සහ සමාන ක්‍රමයකට සිදුකර නොතිබුණු බව එයින් දක්වනු ලැබේ.

(ඊ) දුෂ්කර ප්‍රදේශවල පාසල්වලට අධ්‍යාපන කටයුතු සඳහා ලී බඩු සහ අනෙකුත් උපකරණ ප්‍රමාණවත් පරිදි සපයා නොතිබුණු බව පළාත් පාසල්වල සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී අනාවරණය වී තිබුණි. එම නිසා වයඹ පළාතේ පාසල් 791 ක සහ දකුණු පළාතේ පාසල් 449 ක ශිෂ්‍යයින් සඳහා මේස සහ පුටු ප්‍රමාණවත් පරිදි සපයා නොතිබුණි. ඊට අමතරව, වයඹ පළාතේ පාසල් 172 ක් සහ දකුණු පළාතේ පාසල් 284 ක් සඳහා සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් පරිදි සපයා නොතිබුණි. තවද, වයඹ පළාතේ පළාත් පාසල් 657 ක් ඇතුළුව දිවයිනේ ජාතික සහ පළාත් පාසල් 4,551 ක ශිෂ්‍යයින්ගේ අධ්‍යාපන කටයුතු සඳහා පරිගණක යන්ත්‍ර 2017 දෙසැම්බර් 31 දිනට සපයා නොතිබුණු බව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2017 පාසල් සංගණනය පිළිබඳ වාර්තාවේ දක්වා තිබුණි.